පොදු චක්‍රලේඛ 02/2023

මගේ අංකය- DCDSP/02/18/04
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
පෙට්ටිගලවත්ත,
ගාල්ල.
2023.07. 05

ගරු සභාපති/ සාමාන්‍යාධිකාරි/ කළමණාකරු/ගණකාධිකාරී,
(දකුණු පළාතේ සියළුම සමුපකාර සමිති)

**<u>දකුණු පළාත තුල ලියාපදිංචි සමුපකාර සමිති වලින් සමුපකාර අරමුදලට දායක මුදල් ගෙවීම සම්බන්ධවයි.</u>**

දකුණු පළාත තුල පිහිටුවා ඇති සියළුම ලියාපදිංචි සමුපකාර සමිති සම්බන්ධයෙන් 1989 අංක 12 දරණ පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනත අනුව 1983 අංක 32 හා 1992 අංක 11 දරණ පනත් වලින් සංශෝධිත 1972 අංක 05 දරණ සමුපකාර සමිති පනත හා එම පනතේ 61 වෙනි වගන්තිය යටතේ සකස් කරන ලද 1973 සමුපකාර සමිති රීති මාලාව අදාල වේ.

02. උක්ත සමුපකාර පනතේ 43.(1)(ආ) වගන්තිය අනුව සෑම සමුපකාර සමිතියක්ම සිය ශුද්ධ ලාභයෙන් රීති මගින් නියම කරනු ලබන යම් කොටසක් සමුපකාර අරමුදලට දායක මුදලක් වශයෙන් ගෙවිය යුතු අතර, 1973 සමුපකාර සමිති රීති මාලාවේ 43.(ii) වගන්තිය අනුව සමිති විසින් එලෙස සමුපකාර අරමුදල සඳහා ගෙවිය යුතු දායක මුදලේ ප්‍රමාණය රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කල යුතු වන අතර, එම ප්‍රමාණය සමිතියේ වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට දහයකට වැඩි නොවන රුපියල් 5.00 කට අඩු නොවන මුදලක් විය යුතුවේ.

03. ඒ අනුව සමුපකාර සමිති රීති මාලාවේ 43.(ii) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දකුණු පළාත තුල පිහිටුවා ඇති සෑම ලියාපදිංචි සමුපකාර සමිතියක්ම සිය ශුද්ධ ලාභයෙන් 10%ක් දායක මුදලක් වශයෙන් සමුපකාර අරමුදලට ගෙවිය යුතු බවට මෙයින් නියම කරමි. (සමුපකාර සමිතිය අදාල වර්ෂයේ ශුද්ධ අලාභයක් ලබා ඇත්තේ නම් සමුපකාර අරමුදලට දායක මුදල් ගෙවීමේ ඉහත විධිවිධානය අදාල නොවේ.)

04. ඉහත පරිදි යම් සමුපකාර සමිතියක් විසින් කිසියම් වර්ෂයකට අදාලව සමුපකාර අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු ප්‍රමාණය, උක්ත සමුපකාර පනතේ 43.(1) වගන්තිය අනුව විගණක විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, එම මුදල අදාල සමුපකාර සමිතිය විසින් විගණන වාර්තාව කාර්යාලයෙන් නිදහස් කරනු ලබන අවස්ථාවේදී හෝ ඊලඟ විගණනය ආරම්භ වීමට ප්‍රථම සම්පූර්ණයෙන් දිස්ත්‍රික්කය භාර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වෙත ගෙවිය යුතු වේ,

05. ඉහත කරුණු කෙසේ වුවද සමුපකාර සමිතියක් විසින් අදාල වර්ෂයේ සමුපකාර අරමුදලට ගෙවිය යුතු දායක මුදල එම වර්ෂයේ විගණනය අවසන්වී හයමසක් ඇතුළත තම දිස්ත්‍රික්කය භාර සහකාර කොමසාරිස් කාර්යාලයට ගෙවා නිම කල යුතුය.

05. තවද සෑම ලියාපදිංචි සමුපකාර සමිතියක්ම සමිතියේ ආදායම් හා වියදම් පිළිබඳ නියමිත ප්‍රමිතීන්ට අනුව නිසි ගිණුම් පැනවීම හා පවත්වාගෙන යාම සිදු කල යුතු අතර මෙම නියමයන් අනුව කටයුතු කිරීම සෑම සමුපකාර සමිතියකම වගකීමක් වන බවද කාරුණිකව දන්වමි.

**(සැලකිය යුතුයි- දකුණු පලාත තුල ලියාපදිංචි සමුපකාර සමිතියක් විසින් සමුපකාර අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු ප්‍රමාණය සම්බන්ධයෙන් ඉදිරියේදී ගරු ආණ්ඩුකාරතුමා විසින් ලබා දෙන උපදෙස් අනුව මෙම චක්‍රලේඛයේ සිදු කරන සංශෝධනයන්ට හා දකුණු පළාත් සභාවේ 2019 අංක 06 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන අවස්ථාවක එහි සඳහන් විධිවිධාන වලට යටත්ව මෙම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක විය යුතු වේ.)**

ටී.ජී සරත් කුමාර,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත.

ටී. ජී. සරත් කුමාර
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
දකුණු පළාත

පිටපත්-

01.සහකාර කොමසාරිස්(ගාල්ල/මාතර/හම්බන්තොට)- අදාල සියළුම සමුපකාර සමිති දැනුවත් කිරීම සඳහා මෙන්ම විගණන නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා

02.සියළුම සමිති භාර නිලධාරීන් - තම බල ප්‍රදේශයේ පවතින සියළුම සමුපකාර සමිති මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට

03.සියළුම සමුපකාර සංවර්ධන නිලධාරීන් - විගණනයේදී මේ අනුව කටයුතු කිරීම සඳහා